# වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
# வடமேல் மாகாண சுகாதார சேவைகள் திணைக்களம்
# Department of Health Services – Northwestern Province

සෞඛ්‍ය සංකීර්ණය,
මිගමු පාර,
කුරුණෑගල. 60000

சுகாதார வளாகம்
நீர்கொழும்பு வீதி
குருநாகல் 60000

Health Complex.
Negambo Road,
Kurunegala. 60000

Web : www.healthdept.nw.gov.lk
E-Mail : info@healthdept.nw.gov.lk


මගේ අංකය / எனது இல / My No : NWP/PDHS/CMA/CIRCULR/01
ඔබේ අංකය / உமது இல. / Your No :
දිනය / திகதி / Date : 2022.08.12

අභ්‍යන්තර චක්‍රලේඛ අංක – NWP/PDHS/02-02/02/02/2022

ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,

කුරුණෑගල/ පුත්තලම

සියළුම ආයතන ප්‍රධානීන්

**<u>වයඹ පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් සියළුම සෞඛ්‍ය ආයතනවල පරිහරණ කරනු ලබන වාහන අනතුරු සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය</u>**

මෙයට පෙර රථවාහන පිළිබඳ නිකුත් කරන ලද අභ්‍යන්තර චක්‍රලේඛ අංක NWP/PDHS/E/8/2021/3 හා 2021.08.20 දිනැති ලිපියට වැඩිමනක් වශයෙනි.

02. මෙම දෙපාර්තමේන්තුවට අයත් සියළුම සෞඛ්‍ය ආයතනවල පරිහරණය කරනු ලබන රථවාහන අනතුරුවලට භාජනය වු අවස්ථාවකදි හා අනතුරෙන් පසුව අළුත්වැඩියාව සිදු කිරිමේදි පහත සඳහන් උපදෙස්වලට අනුව කටයුතු කරන ලෙස මින් උපදෙස් දෙමි.

i. රථවාහනයක් ඔබ භාරයට නිකුත් කිරිමෙන් පසු අදාළ රථවාහනයේ ධාවන තත්ත්වය, ඉන්ධන පරික්ෂාව සිදු කර භෞතික තත්ත්වය සම්බන්ධව ඡායාරූප සහිතව එක් එක් රථවාහනය සඳහා වෙන් වෙන් වශයෙන් ලිපිගොනු පවත්වා ගත යුතු අතර එහි පිටපතක් ලිඛිතව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය වෙත යොමු කළ යුතුය.

ii. රථවාහනය භාර ගන්නා අවස්ථාවේ රථවාහනයේ භෞතිකව යම් දෝෂ තිබේ නම් ඒ සම්බන්ධයෙන් ලිඛිතව වාර්තා කළ යුතුය.

iii. රථවාහනය ආයතනයට ලැබිමෙන් පසු පූර්ණ ආරක්ෂාව යටතේ වාහනය තබා ගත යුතු අතර ඉන්පසුව සෑම කාර්තුවකම ආරම්භක සතියේ දිනක එම වාහන නැවත පරික්ෂාවට ලක් කර එහි තත්ත්වය පිළිබඳව වාර්තාවක් තබා ගත යුතුය . (මේ සමඟ අමුණා ඇති ආකෘතියට අනුව ලේඛනයක් පවත්වා ගත යුතුය )

iv. රථවාහනය පරික්ෂා කරන අවස්ථාවේදි රථවාහනයේ භෞතිකව යම් දෝෂ තත්ත්වයක් තිබේනම් එයට අදාළ ඉදිරි ක්‍රියා මාර්ග ගත යුතුයි.


☎ : (+94 ) 037-22 23479, 037-22 26758, 037-22 21359, 037-22 25584 📠 : (+94) 037-22 25581

v. රථවාහන අනතුරක් සිදුවූ අවස්ථාවකදි ප.මු.රී. 54.1.1 අනුව එම අනතුර සම්බන්ධයෙන් ආයතන ප්‍රධානී විසින් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත පිටපතක් සහිතව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් වෙත දැනුම් දීමට කටයුතු කළ යුතුය. ( ප.මු.රී. වගන්තිවල පිටපත් අමුණා ඇත)

vi. පළාත් මූල්‍ය රීති 54.3.1 අනුව අනතුර වූ වහාම එම අලාභයේ ප්‍රමාණය හා එයට හේතු නිශ්චය වශයෙන් දැන ගැනීමට ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් විසින් ප.මු.රී. අනුව 54.5 නියමිත කාල සීමාව තුළදී ප්‍රාරම්භක වාර්තාව යොමු කළ යුතුය. ප්‍රාරම්භක වාර්තාවේ අංක 03 යටතේ නැති වූ භාණ්ඩ පිළිබඳ විස්තරවලට අදාලව නිශ්චිත ගණන අනිවාර්යෙන්ම සඳහන් කළ යුතුය. එමෙන්ම අනතුරට අදාළ පොලිස් වාර්තාවද මේ සමඟ යොමු කළ යුතුය.

vii. අනතුරට පත් රථවාහනයේ අලාභයේ ප්‍රමාණයට අදාළව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් විසින් ප.මු.රී. 58 අනුව අනුමැතිය ලබා ගත යුතුය.

viii. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් පළාත් මූල්‍ය රීති 54.6 අනුව කටයුතු කර පූර්ණ වාර්තාව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතුය.

ix. අනතුරටපත් රථවාහනයක් අළුත්වැඩියාව සඳහා යොමු කිරීමේදි එම රථවාහනයේ කාල සීමාව වසර 05 කට වඩා අඩුනම් අදාළ නියෝජිත ආයතනය වෙතද ඊට වඩා වැඩි අවස්ථාවලදි යන්ත්‍රෝපකරණ අධිකාරිය වෙත යොමු කරන්නේද එසේ නැතහොත් විශේෂිත වූ රක්ෂණ සමාගම විසින් එකඟතාවයට පත්ව ඇති ගරාජය මඟින් සිදු කරන්නේද යන්න පිළිබඳව තීරණය, ගැනීමට රථ වාහනයේ අනතුරේ ස්වභාවය මත ආයතන ප්‍රධානි විසින් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ නිර්දේශය සහිතව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතුය.

x. අනතුරට පත් රථවාහනය හැකි සෑම අවස්ථාවකදීම බලයලත් නියෝජිත ආයතනය වෙත අළුත්වැඩියාව සඳහා යොමු කළ යුතු අතර රථවාහනයේ නියෝජිත ආයතනය වෙතින් බලයලත් ගරාජ සම්බන්ධ ලැයිස්තුවක් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ගෙන්වා ගත යුතුය.

xi. රථවාහනය අළුත්වැඩියාව සිදු කිරීමේදි ඇතැම් උපාංග නියෝජිත ආයතනය මඟින් සපයා ගත නොහැකි අවස්ථාවලදි වෙනත් ආයතනයකින් අවශ්‍ය උපාංග ගෙන්වා ගැනීම සඳහා පූර්ව අනුමැතිය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගෙන් ලබා ගත යුතුය.

xii. විවෘත මිළ ගණන් කැඳවීමේදි යාන්ත්‍රික ඉංජිනේරු හෝ මෝටර්රථ කාර්මික නිළධාරිගේ නිර්දේශය මත වඩා ඉක්මනින් හා අවංකව හා ගුණාත්මකව අඩුම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ගරාජයක් තෝරා රථවාහනයේ අළුත්වැඩියාව උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව සිදු කිරීමට කටයුතු කළ යුතුය.

xiii. සෑම අනතුරකටම පසු පළාත් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුට හෝ යන්ත්‍රෝපකරණ අධිකාරියේ මෝටර් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු වෙත යොමු කොට ඔහුගේ නිර්දේශ සහිත පූර්ණ වාර්තාවක් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මඟින් අනතුරේ ස්වභාවය අනුව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ලිඛිතව වාර්තා කළ යුතුය.

xiv. සියළුම රථ වාහන පූර්ණ රක්ෂණාවරණය නොමැතිව ධාවනයේ නොයෙදිය යුතු අතර යම් හෙයකින් ධාවනයේ යොදවා අනතුරකට භාජනය වුවහොත් එහි පාඩු පූර්ණය කිරීමේ වගකීම අදාළ ආයතන ප්‍රධානී හා අදාළ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් දැරිය යුතුය.

xv. පූර්ණ රක්ෂණාවරණය අහිමි වීමක් සිදු වන්නේ යම් හෙයකින් රියැදුරු මත්පැන්, මත්ද්‍රව්‍ය හෝ රියැදුරු බලපත්‍රයක් නොමැතිව ධාවනය කිරීමෙන් පමණක් වන හෙයින් නම් එලෙස යම් වූ අඩුපාඩුවක් සිදු නොවීමට අවශ්‍ය සියළු ක්‍රියා මාර්ග ආයතන ප්‍රධානීන් විසින් හා ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් විසින් ගත යුතුය.

xvi. අනතුරට පත් වූ රථයක් අදාළ අළුත්වැඩියාව නිම කිරීමෙන් පසු පළාත් ඉංජිනේරුවරුන්ගේ යාන්ත්‍රික ඉංජිනේරු වාර්තාව සමඟ රථ වාහනය නැවත වරක් ඡායාරූ ගත කර ආයතන ප්‍රධානි හා ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් පෞද්ගලිකව නිරීක්ෂණය කොට සෑහීමට පත්වන්නේද යන්නත් අඩුපාඩු පවතින්නේද යන්නත් බලා අඩුපාඩු තිබේනම් එම අඩුපාඩු නිවැරදි කිරීමට වහාම කටයුතු කළ යුතුය.

xvii. ඒ පිළිබඳව අදාළ අළුත්වැඩියාව සිදු කරන ලද ගරාජය වෙත හෝ නියෝජිත ආයතනයට පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත පිටපතක් සහිතව දැන්විය යුතු අතර සියළු කටයුතු නිවැරදි කිරීමෙන් පසුව ඡායාරූප ගත කොට වයඹ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ විෂයභාර නිළධාරිට ඡායාරූපයේ පිටපතක් යොමු කොට නැවත පරිහරණය සඳහා අදාළ ආයතනය වෙත කඩිනමින් භාරදීමට ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් කටයුතු කළ යුතුය.

xviii. අළුත්වැඩියාවෙන් ඉවත් කරනු ලබන සියළුම අබලි ද්‍රව්‍ය ඇත්නම් යන්ත්‍රෝපකරණ අධිකාරිය වෙත ලබාදීමට අදාළ විෂය භාර නිළධාරි විසින් කටයුතු කළ යුතුය.

xix. යාන්ත්‍රික ඉංජිනේරු හා ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ පෞද්ගලිකවම කරන ලද අළුත්වැඩියාව පිළිබඳව සෑහීමට පත්වන්නේ නම් පමණක් අදාළ ගෙවීම් සිදු කිරීමට ක්‍රියා කළ යුතු අතර සෑම විටම අදාළ අළුත්වැඩියාව සඳහා ලබාදෙන ලද වගකීම් කාලය ආයතනයට අදාළ රථය භාර දුන් දිනයේ සිට ගණනය කොට ඒ අනුව ඉදිරි අළුත්වැඩියා සිදු කිරීමේදී නව අළුත්වැඩියාවන් පැරණි අළුත්වැඩියාවට සම්බන්ධද යන්න ආයතන ප්‍රධානි විසින්ම ඉංජිනේරුද සමඟද එක්ව නිරීක්ෂණය කොට පෞද්ගලිකව වගකිව යුතුය. එමෙන්ම රාජ්‍ය මුදල් අපතේ යාම හෝ අවභාවිතය වළක්වා ලීමට කටයුතු කළ යුතුය.

xx. රථවාහන සඳහා පූර්ණ රක්ෂණාවරනය ලබා ගැනීමේදී ගිලන් රථයක ඉදිරි කැබින් කොටුව ( FRONT CABIN ) ගමන් ගන්නා දෙදෙනෙකු වෙනුවෙන්ද (රියැදුරු හා රිය සහායක) පසුපස කොටසේ ගමන් ගන්නා (REAR CABIN) රෝගියා, වෛද්‍ය නිළධාරි,හෙද නිළධාරි,සෞඛ්‍ය කාර්ය සහායක හෝ උපස්ථායක වශයෙන් 04 දෙනෙකුට වශයෙන්ද සම්පූර්ණ ගිලන් රථය සඳහා පුද්ගලයින් 06 දෙනෙකුට අවශ්‍ය පූර්ණ රක්ෂණාවරනය ලබා ගැනිමට කටයුතු කළ යුතුය.

xxi. කැබ් රථයක නම් මගී ප්‍රවාහන අසුන් සංඛ්‍යාව අනුව අවම වශයෙන් හතර දෙනෙකු සඳහා පූර්ණ රක්ෂණාවරනය ලබා ගත යුතු අතර ලොරි රථවලට 04 දෙනෙකු සඳහා පූර්ණ රක්ෂණාවරනය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

xxii. යම් හෙයකින් අනතුරට පත් වාහනයක් අපහරණ ක්‍රියාවලියට යොමු කරනු ලබන්නේ නම් ඒ සම්බන්ධයෙන් මූලික විමර්ශන කටයුත්තක් පවතින්නේද යන්න පරීක්ෂා කළ බලා නිර්දේශ ඉදිරිපත් කළ යුතුය.

02. මෙම සියළු උපදෙස් ඔබ ආයතනවල වගකිව යුතු යටහත් නිළධාරින්ට , සියළු රියැදුරන්ටත් ඍජුව ලබා දිමට හා රාජ්‍ය සම්පත් මැනවින් පරිහරණය කිරිමට කටයුතු කිරිම අපගේ සාමුහික වගකිමක් බවත් අවධාරණය කොට විශේෂයෙන්ම රෝහල් ගිලන් රථ සේවාව ඉතා ගුණාත්මක හා සුරක්ෂිත කාර්යක්‍ෂම සේවාවක් බවට පත්කරලිමට ඔබගේ ඔබ සියළු දෙනාගේ ඍජු මැදිහත්විම මා අපේක්‍ෂා කරමි .

විශේෂඥ වෛද්‍ය එම්.කේ. සම්පත් ඉන්දික කුමාර,

වයඹ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ

වෛද්‍ය එම්.කේ. සම්පත් ඉන්දික කුමාර
MBBS, MSc MD, MCMA
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ
වයඹ පළාත,
කුරුණෑගල.

පිටපත්

01. ගරු ආණ්ඩුකාරවර – වයඹ කා.දැ.පි
02. ප්‍රධාන ලේකම් -වයඹ කා.දැ.පි.
03. ලේකම් - සෞඛ්‍ය අමාත්‍යාංශය (වයඹ) කා.දැ.පි.
04. සහකාර විගණකාධිපති කා.දැ.පි.
05. නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ / නියෝජ්‍ය අධ්‍යක්‍ෂ (පරිපාලන) දැ.පි.

(ඇ) පළාත් සභාවේ දේපළකට අලාභ හානි වීම.

(ඈ) නිලධාරියෙකුගේ නොසැලකිල්ල, අපරීක්ෂාකාරී බව ප්‍රමාදය හෝ අතපසුවීමක් නිසා සිදුවී ඇති අලාභ හානිවලට වන්දි වශයෙන් දරනු ලබන වියදම්.

(ඉ) අධි ගෙවීම්, අක්‍රමික හෝ සාවද්‍ය ගෙවීම් හෝ වැරදි පාර්ශවයන්ට කරනු ලබන ගෙවීම්

(ඊ) පාවිච්චි කළ හෝ පාවිච්චි නොකළ උපපත්‍රිකා පොත් නැතිවීම

52.2 පහත සඳහන් වන හානි සහ අලාභ ඉහත 52.1 යටතේ වූ හානි පාඩු හා හානි යන්නට අදාල නොවේ.

(අ) අත්තිකාරම් ගිණුම් කටයුතු සම්බන්ධ වාර්ෂික අවසාන ගිණුම් වලින් පැන නගින වෙළඳ පාඩු හෝ ඌණතාව

(ආ) ස්ථාවර වත්කම්වල වාර්ෂික ක්ෂයවීම් හෝ අගය අඩුවීම්

(ඇ) වැව්කණඩි, බෝක්කු, පාලම්, මංමාවත් හා ගොඩනැගිලි යනාදියට ස්වාභාවික ව්‍යසනයන්ගෙන් සිදුවන අලාභ හානි

(ඈ) අයකර ගත නොහැකි හිඟ ආදායම් හා බොල් ණය

(ඉ) ස්වාභාවිකව සිදුවන වියළීම්, හැකිලීම් හා දිරාපත් වීම ආදිය නිසා සිදුවන අලාභ

**(අංක 53 යටතේ පළාත් මූල්‍ය රීති පනවා නැත.)**

## ප.මු.ර.54 නැති වීම් හා අලාභහානි පිළිබඳ කටයුතු කිරීම.

54.1 නැතිවීම් අලාභ හෝ හානියක් සිදුවූ කල්හි ගතයුතු ක්‍රියාමාර්ග

54.1.1 අදාල වන කල්හි නැතිවීම් අලාභ හා හානිවීම් පිළිබඳ ප.මු.ර. 54.4 අනුව නිසි අධිකාරීන්ට වාර්තා කළ යුතුය.

54.1.2 සොරකම්, වංචා, හදිසි අනතුරු යනාදිය වැනි ඇතැම් වර්ග වල හානි සම්බන්ධයෙන් වූ විට පොලීසියට වාර්තා කළ යුතුය.

54.1.3 වහාම පරීක්ෂණ පවත්වා වගකිව යුත්තන් නිශ්චය කළ යුතුය

54.1.4 ඒ හා සම්බන්ධ පොත් පත්, වාර්තා, ලියවිලි,සාක්ෂි ආදිය. සුරක්ෂිතව තැබීමට ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන යෙදිය යුතුය

54.1.5 නැතිවීම් හා හානිවීම් අදාල නැතිවීම් හා හානිවීම් ප.මු.ර.60.1.2 පරදිවූ ලේඛණයෙහි ඒ අලාභය පිළිබඳ සටහනක් කළ යුතුය

54.1.6 අලාභයට වගකිව යුතු නිලධාරීන් විසින් ඒ සඳහා ගෙවිය යුතු වන මුදල නිශ්චය කොට එම මුදල පූරණය කරන ලෙස ඔවුන්ට නියම කොට එය අය කර ගැනීමට ක්‍රියා කළ යුතුය

54.1.7 එවැනි නැතිවීම් හා හානිවීම් නැවතත් සිදුවීම වැලැක්වීමට ප්‍රමාණවත් පියවර ගත යුතුය.

54.1.8 අවශ්‍ය තන්හි අදාල වගකිවයුතු එක් එක් නිලධාරියාට විරුද්ධව වෙන් වෙන් වශයෙන් පියවර ගත යුතුය.

ඇමුණුම් අංක 01

ආකෘති පත්‍ර අංක - NWP/PDHS/AD/06/40

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය

## වාහනවල භෞතික තත්ත්වය පරීක්ෂා කිරීම

වර්ෂය - වාහන අංකය - රියැදුරුගේ නම -

| අනු අංකය | පරීක්ෂාවට ලක්කරන ලද කොටස | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව |
|---|---|---|---|---|---|
| 01 | Front Bumper | | | | |
| 02 | Front Number Plate | | | | |
| 03 | Head Light R/L | | | | |
| 04 | Front Shell | | | | |
| 05 | Bonnet/Hood | | | | |
| 06 | Front Fender R/L | | | | |
| 07 | Front Door Post R/L | | | | |
| 08 | Front Windscreen | | | | |
| 09 | Wiper | | | | |
| 10 | Front Signal Light R/L | | | | |
| 11 | Fog Light R/L | | | | |
| 12 | Side Mirror R/L | | | | |
| 13 | Front Door R/L | | | | |
| 14 | Front Window Glass R/L | | | | |
| 15 | Rear Door R/L | | | | |
| 16 | Rear Window Glass R/L | | | | |
| 17 | Side Door | | | | |
| 18 | Side Door Glass | | | | |
| 19 | Side Panel R/L | | | | |
| 20 | Rear Fender R/L | | | | |
| 21 | Rear Dicky Door | | | | |
| 22 | Rear Bumper | | | | |
| 23 | Rear Signal Light R/L | | | | |
| 24 | Tail Lamp R/L | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 25 | Rear Number Plate | | | | |
| 26 | Roof | | | | |
| 27 | Rear Windscreen | | | | |
| 28 | Door Lock Nobs | | | | |
| 29 | Door Lock Handles (In/Out) | | | | |
| 30 | Door Winder Handles | | | | |
| 31 | Foot Board | | | | |
| 32 | Tyres | | | | |
| 33 | Spare Wheel | | | | |
| 34 | Jack and Handle | | | | |
| 35 | Wheel Brush | | | | |
| 36 | Hood Mirror | | | | |
| 37 | Hood Lamp/Room Lamp | | | | |
| 38 | Dash Board | | | | |
| 39 | Speedo Meter | | | | |
| 40 | Milo Meter | | | | |
| 41 | Heat Meter | | | | |
| 42 | Fuel Meter | | | | |
| 43 | Dash Board Indicator Bulbs | | | | |
| 44 | Electric Horn/Siren Horn | | | | |
| 45 | Steering Wheel | | | | |
| 46 | Radio/CD Player | | | | |
| 47 | Antenna | | | | |
| 48 | Seats | | | | |
| 49 | Floor Carpet | | | | |
| 50 | Beacon Light | | | | |

පරීක්ෂා කරන ලද නිලධාරියාගේ නම හා අත්සන -